මීද්දෙණිය කාරියමඩිත්ත රෝහලේ වෛද්‍යවරයෙකු, රාජකාරි අවස්ථාවේ හෙදියක විසින් ලබාදුන් කිරි කෝප්පයක් පානය කිරීමෙන් පසුව රෝගාතුර වී ඇති බව පුවත්පත් වාර්තා කර තිබිණි.
මෙම පුවත, අප්‍රේල් 10, 2022 දින පුවත්පත් සිරස්තල දෙකක් ඔස්සේ දැක්වෙන්නේ මේ ලෙසිනි.
අරුණ - "හෙදියගේ කිරි බී දොස්තර ලෙඩ වෙයි"
ලංකාදීප - "හෙදියගේ තේ කෝප්පෙන් දොස්තරට සිහි නැතිවෙලා"
බොහෝ විට පුවත් වාර්තාවන්ට සිරස්තල යොදන්නේ එම පුවත ලියූ මාධ්‍යවේදියා විසින් නොව, පුවත්පත් කර්තෘවරයෙකු විසින් බව මාධ්‍යවේදීන් විසින්ම අප වෙත පෙන්වා දී ඇති කරුණකි.
මෙම අරුණ පුවත් සිරස්තලය කෙතරම් ආචාරධාර්මික ද, යෝග්‍ය ද යන කරුණ, සමාජ මාධ්‍ය තුළ ද බොහෝ කතාබහට ලක්වී තිබිණි.
එම පසුතලය මත බලන කළ,
1) මෙම සිරස්තල සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?
2) වඩාත් යෝග්‍ය පුවත් සිරස්තලය ලෙසින් ඔබ තෝරාගන්නේ කුමක් ද
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

